**ශීර්ෂ 313 - මධ්‍යම පළාත් සභාව - 2025**

**-----------------------------------------**

## 1. දැක්ම,මෙහෙවර හා කාර්යභාරය

### 1.1 දැක්ම

මධ්‍යම පළාතේ අභිමානවත් ජනතාවට සෞභාග්‍යමත් ජීවිතයක් ලබාදීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පළාත් සභාව බවට පත් කිරීම.

### 1.2 මෙහෙවර

මධ්‍යම පළාතේ මුළු මහත් ජනතාවට උරුම සංස්කෘතික, සමාජ, ආර්ථික තත්ත්වයන් හා ස්වාභාවික පරිසරය රැකෙනා අයුරින් නවීන තාක්ෂණය භාවිතා කර මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් මධ්‍යම පළාතේ ජනතාවට තිරසාර අභිමානවත්, උසස් ජීවන තත්ත්වයක් උදාකර දීම.

### 1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

## 2. මුළු ප්‍රතිපාදනය හා වියදම

ශීර්ෂ 313 මධ්‍යම පළාත් සභාව සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සහ පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කරන ලද මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 70,285 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට එයින් රු. මිලියන 67,669.23 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව, ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 2,615.77 ක් හෙවත් සියයට 3.72 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2025 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන | මුළු වියදම රු.මිලියන | ඉතිරිය රු.මිලියන | % |
| පුනරාවර්තන | 60,997.00 | 59,750.30 | 1,246.70 | 2.04 |
| ප්‍රාග්ධන | 9,288.00 | 7,918.93 | 1,369.07 | 14.74 |
| එකතුව | 70,285.00 | 67,669.23 | 2,615.77 | 3.72 |

## 3. විගණන නිරීක්ෂණ

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.